# ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය - 2012

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ කුඩා හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 කුඩා හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (SLFRS) වලට අනුකූල නොවීම

පහත දැක්වෙන අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| කුඩා හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) අංක 17 කොටස | දේපල, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කරන්නේ නම් අදාල වත්කම අයත් කාණ්ඩයේ සියලුම දේපල, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කළ යුතුය. එසේ වුවත්, අධිකාරිය සතු සියලුම ඉඩම් සහ ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කිරීමෙන් තොරව, ප්‍රධාන කාර්යාලය පිහිටි ඉඩම හා ගොඩනැගිලි පමණක් ප්‍රත්‍යාගණනය කර රු. මිලියන 1,378 ක් වූ ප්‍රත්‍යාගණන අගය මත මූල්‍ය ප්‍රකාශවල පෙන්නුම් කර තිබුණි. අනෙකුත් ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය නොකිරීම නිසා අධිකාරියේ ඉඩම් ගොඩනැගිලිවල සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවලින් පෙන්නුම් නොකෙරේ. |

(ආ) අංක 20 කොටස

මෙහෙයුම් කල්බදු යටතේ ලබා දී ඇති වත්කම් , ඒවායේ ස්වභාවය අනුව කල්බදු දෙන්නාගේ තත්ත්ව ප්‍රකාශනයේ දැක්විය යුතු වේ. එසේ වුවත් මෙහෙයුම් කල්බදු යටතේ ලබා දී තිබුණු ඉඩම් හා තානායම් අධිකාරියේ තත්ත්ව ප්‍රකාශනයේ පෙන්නුම් කර නොතිබුණි. සාක්ෂි සහිතව එම ඉඩම් හා තානායම්වල විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

1.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) අය කරගත යුතු ණයවල ස්වභාවය සහ අය කර ගැනීමේ හැකියාව පිළිබඳ නොසලකා අඩමාන ණය වෙන්කිරීම සඳහා වූ ගිණුම්කරණ ප්‍රතිපත්තිය වර්ෂ 2 සිට 4 දක්වා අයවීම ප්‍රමාදව පවතින ණයගැතියන් සඳහා සියයට 25 සිට සියයට 100 දක්වා වන පරිදි සකස් කර තිබුණි. මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක්ද ලබාගෙන නොතිබුණි.

(ආ) දිගු කාලීන හා කෙටි කාලීන බදු පදනම මත ලබාදී ඇති ඉඩම් හා ගොඩනැගිලිවලින් අය කරනු ලබන බදු අනුපාතය තීරණය කිරීමට අදාල ප්‍රතිපත්තිය ගිණුම්වල හෙළිදරව් කර නොතිබුණි.

1.2.3 නොසැසඳූ පාලන ගිණුම්

අදාල උපයෝගී වාර්තාවල සඳහන් ශේෂයන් සමග සැසඳීම නොකිරීම නිසා අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන සහ අදාල උපයෝගී වාර්තා අතර පහත සඳහන් වෙනස්කම් නිරීක්ෂණය විය.

| විස්තරය | මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය රු. | උපයෝගී මූල්‍ය වාර්තාවල විස්තරය | උපයෝගී මූල්‍ය වාර්තා අනුව ශේෂය රු. | වෙනස රු. |
|---|---|---|---|---|
| ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයට ගෙවිය යුතු මුදල් | 26,848 | ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය | 20,170,673 | 20,143,825 |
| ශ්‍රී ලංකා හෝටල් හා කළමනාකරණ ආයතනයට ගෙවිය යුතු මුදල් | 6,511,960 | ශ්‍රී ලංකා හෝටල් හා කළමනාකරණ ආයතනයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය | 61,337,342 | 54,825,382 |
| ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයෙන් ලැබිය යුතු මුදල් | 26,948,539 | ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය | 24,371,042 | 2,577,497 |

1.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

වෙළඳ ණය ගැතියන්ගෙන් ලැබිය යුතු රු.1,978,954 ක් වර්ෂ 4 කට වැඩි කාලයක්ද රු.96,514 ක් වර්ෂ 3 කට වැඩි වර්ෂ 4කට අඩු කාලයක්ද හිඟව පැවතුණි. මෙයට අමතරව, රු.1,748,633 ක්වූ විවිධ ණය ගැතියන් වර්ෂ 4කට වැඩි කාලයක් හිඟව පැවතුණි.

1.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත දැක්වෙන ආයෝජන වර්ගීකරණය අනුව ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ලබා නොදීම නිසා එම ආයෝජන සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය.

| ආයෝජන වර්ගීකරණය | වටිනාකම රු | ඉදිරිපත් නොකල සාක්ෂි |
|---|---|---|
| ක්ෂය ආයෝජන (සංචාරක මණ්ඩලය) | 52,154,737 | (i) ආයෝජන සහතිකය හෝ වෙනත් ලිඛිත ලියවිල්ලක්<br>(ii) ශේෂය සනාත කිරීමේ ලිපි |
| ක්ෂය ආයෝජන (සංචාරක ප්‍රවර්ධන) | 976,509 | |
| නිධන් අරමුදල් | 759,021 | (i) කොටස් සහතික හෝ වෙනත් ලිඛිත ලියවිල්ලක්<br>(ii) ශේෂය තහවුරු කිරීමේ ලිපි |
| ශ්‍රී ලංකා සීමිත හෝටල් සංචාරක සමාගම | 750,000 | |

1.2.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනත | |
| (i) 1 පරිච්ඡේදයේ 12(4)(iii) වගන්තිය | පෞද්ගලික හෝටලයකට ලංකා බැංකුවෙන් නිකුත් කළ රු.මි.100 ක ණය මුදලට අදාල පොලියෙන් රු.6,290,068 ක් අධිකාරිය විසින් දැරීමට අදාල අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

| | |
|---|---|
| (ii) 1 පරිච්ඡේදයේ 7(3) වගන්තිය | ඉහත ණය පොලිය අධිකාරිය විසින් දැරීමට 2010 ජුනි 6 දින අධ්‍යක්ෂ මණ්ඩලය ගත් තීරණය බලාත්මක කිරීමට අවශ්‍ය අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික සංඛ්‍යාව 5 ක් වූ ගණ පූර්ණය නොතිබුණි. |
| (ආ) 1995 ජුලි 12 දිනැතිව ජනාධිපති ලේකම් විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ චක්‍රලේඛය | රජයේ ඉඩම් බදු දීමේදී බදු ගිවිසුම සහ බදු මුදල වර්ෂ 5 න් 5 ට සංශෝධනය කල යුතු වුවද අධිකාරිය විසින් බදු දී තිබුණු ඉඩම් සම්බන්ධයෙන් මෙම චක්‍රලේඛයට අනුකූලව කටයුතු කර නොතිබුණි. |
| (ඇ)2003 ජුනි 02 දිනැති අංක පී.ඊ.ඩී12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ | |
| (i) 9 පරිච්ඡේදයේ 9.3.1 (i) වගන්තිය | බඳවා ගැනීමේ හා උසස් කිරීමේ යෝජනා ක්‍රමය පාලක සභාව සහ අමාත්‍යාංශය විසින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟතාවය ඇතිව අනුමත කල යුතු වුවත්, "වන් ස්ටොප් යුනිට්" නම් වූ අංශයට බඳවා ගැනීම් මෙම නියමයන්ට අනුකූළව සිදු කර නොතිබුණි. |
| (ii) 9 පරිච්ඡේදයේ 9.14.1 වගන්තිය | මානව සම්පත් කළමනාකරණයට අදාල නීති හා රෙගුලාසි පිළිබඳ සියලු කරුණු ඇතුළත් මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පරිච්ඡේදයක් සහිත පටිපාටි සංග්‍රහය භාණ්ඩාගාර ලේකම්ගේ එකඟතාවය සහිතව පාලක මණ්ඩලය විසින් අනුමත කල යුතු වුවත්, අධිකාරිය එම අවශ්‍යතාවන්ට අනුකූලව කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ඇ) 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | එ.ජ ඩොලර් මිලියන 30 කට වැඩි විදේශ අරමුදල් යොදවන ව්‍යාපෘතියක කාර්ය මණ්ඩලයට ගෙවීම සඳහා නිශ්චය කර ඇති වැටුප් ඉක්මවා කල්පිටිය ව්‍යාපෘතියක කාර්ය මණ්ඩලයට 2009 වර්ෂයේ සිට 2011 දෙසැම්බර් 31 දක්වා රු.3,780,253 ක් වැඩියෙන් ගෙවා තිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ වැඩ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.183,037,093 ක අතිරික්තයක් වූ අතර,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.132,206,537 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 50,830,556 ක වර්ධනයක් දැක්වුණි. රු.61,771,573 කින් සංචාරක සංවර්ධන හා අපගමන බදු සහ වෙනත් ආදායම් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයෙහි වැඩි වීමට මූලික හේතුව වී තිබුණි.

2.2 විග්‍රහාත්මක සමාලෝචනය

----------------------------

සමාලෝචිත වර්ෂයේදී අධිකාරියේ ආදායම රු.මිලියන 406 ක් වූ අතර එය ඉකුත් වර්ෂයේ වූ රු.මිලියන 345 සමග සැසඳීමේදී සියයට 17.6 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. එසේම ඉකුත් වර්ෂයේ සංචාරක සංවර්ධන කටයුතු වෙනුවෙන් වැය කර තිබුණු රු.මිලියන 213 සමග සැසඳීමේදී සමාලෝචිත වර්ෂය තුලදී ඒ සඳහා රු.මිලියන 223 ක් වැය කර තිබුණි. ඒ අනුව සියයට 4.6 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

සමාලෝචිත වර්ෂය මුළුල්ලේ රු.මිලියන 80 කට වැඩි මුදලක් ඵලදායි ලෙස ආයෝජන කර ගැනීමකින් තොරව බැංකු ගිණුමෙහි පැවතුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නිකේතනවල කාර්යසාධනය

අධිකාරියේ අයිතිය හා කළමනාකරණය යටතේ සංචාරක නිකේතන 04 ක් සහ නිවාඩු නිකේතන 03 ක් පැවතුණි. 2011 වර්ෂයේදී මෙම නිකේතනවල ශුද්ධ අතිරික්තය වූ රු.5,355,575 සමග සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී ශුද්ධ සමුච්චිත අතිරික්තය රු.13,080,510 ක් විය. අධික පොදු කාර්ය වියදම හේතුකොටගෙන එක් නිවාඩු නිකේතනයක රු. 12,012,571 ක ඌණතාවයක් පැවතුනි. මෙහි ප්‍රතිඵලයක් ලෙස උපයා තිබුණු මුළු ආදායම හා සැසඳීමේදී නිකේතන මෙහෙයුම්වල සමස්ත ලාභදායීත්වය සියයට 16.4 ක් පමණ විය.

(ආ) අධිකාරියට සමාලෝචිත වර්ෂය තුළදී හෝ මේවනවිට ඉටු කරගැනීමට නොහැකි වූ අරමුණු හා පරමාර්ථ

2005 අංක 38 දරන සංචාරක කටයුතු පනත අනුව පහත සඳහන් අරමුණු පරමාර්ථ හා කාර්යයන් ඉටු කර ඇති බවට සනාථ කරගැනීමට සාක්ෂි නොතිබුණි.

(i) දිගුකාලීන ඉලක්ක හා සිව් අවුරුදු සැලැස්ම පිළියෙල කිරීම හා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සහ වාර්ෂිකව නව දිගුකාලීන ඉලක්ක ඇතුළත් කිරීමේ අරමුණින් ප්‍රතිශෝධනය කිරීම සහ ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම.

(ii) පනතේ නිශ්චිතව සඳහන් කරුණු සම්බන්ධයෙන් රීති සෑදීම, මේ තුලින් සංචාරක කර්මාන්තය හා ඒ ආශ්‍රිත වෙනත් කර්මාන්තවලට අදාලව, දේශීයව හා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ප්‍රමිති වැඩි දියුණු කිරීම, බලාත්මක කිරීම හා පවත්වාගෙන යාම සඳහා සංචාරක ව්‍යවසායකයන්ට බලපත් ලබා දීම හා බලය ලබා දීම.

(iii) පනතේ අරමුණු මුදුන් පමුණුවා ගැනීමේ පහසුකම් සැලසීම සඳහා සාමාන්‍ය හෝ වෙනත් මණ්ඩල පිහිටුවීම.

(iv) ශ්‍රී ලංකාවේ ඇති සංචාරකයන්ගේ සිත්ගත් ස්ථානවල චාරිකා කරන තැනැත්තන්ට ප්‍රවාහන පහසුකම් සැලසීමේ ව්‍යාපාර කරගෙන යාම.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) ඉඩම් හා දේපල කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ත්‍රිකුණාමලය කුච්චවේලි ප්‍රදේශයෙන් මීට වර්ෂ කිහිපයකට පෙර අධිකාරිය වෙත පවරාගන්නා ලද ඉඩම් අක්කර 510 කට ආසන්න බිම් ප්‍රමාණයකින් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සංවර්ධනය කිරීමට හෝ ආයෝජකයින් වෙත බදු දීමට හෝ කටයුතු සිදු කර තිබුනේ ඉඩම් අක්කර 50ක ප්‍රමාණයකට පමණි.

(ii) මූලික පාලන ක්‍රමයක් ලෙස දේපලවල ඔප්පු පැවරුම්, එකතු කිරීම් හා සංවර්ධනය කිරීම් යනාදී විස්තර දක්වමින් ඉඩම් හා වත්කම් වෙනුවෙන් ලේඛණයක් පවත්වා නොතිබුණි.

(iii) විගණනය විසින් කරන ලද නියැදි පරීක්ෂාවකට අනුව, තානායම් 56ක් හා අක්කර 6,495 ක වපසරියක් සහිත ඉඩම් කැබලි 166 ක් ආයතනයට පවරා ගැනීම සඳහා ගැසට් නිවේදන නිකුත් කර තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසානය දක්වා පවරාගෙන තිබුණේ ඉන් කොටසක් පමණි.

(ආ) බලපත්‍ර නිකුත් කිරීම

---

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සංචාරක සංවර්ධන අධිකාරියේ අනුමැතිය ඇතිව සංචාරකයින් සඳහා පවත්වාගෙන යන ආපන ශාලා හා නිකේතනවලට මුදල් අය කර නිකුත් කරන අවසරපත්‍ර මුද්‍රණය කිරීමේදී අනුක්‍රමික අංකයක් හා පිළිපතක්ද ඇතිව ඒවා මුද්‍රණය කර නොතිබුණි. මෙම අවසරපත්‍ර ගබඩා කිරීම හා නිකුත් කිරීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් ආරක්ෂක විධිවිධාන සැලසෙන පරිදි කළමනාකාරීත්වය ප්‍රමාණවත් අභ්‍යන්තර පාලනයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ii) සංචාරක මාර්ගෝපදේශකයින් සඳහා අධිකාරිය විසින් නිකුත් කරන බලපත්‍ර අත්සන් කරන බල ලත් නිලධාරියාගේ නම, තනතුර හා දිනය ඇතුළත් වන පරිදි නිල මුද්‍රාවක් භාවිතා කිරීමකින් තොරව අත්සන පමණක් බලපත්‍රයට යොදා තිබුණි. මෙම හේතුව නිසා මෙම බලපත්‍ර නිකුත් කිරීම වැරදි භාවිතයට යොදාගැනීම වැලැක්වීමට කළමනාකාරීත්වය ප්‍රමාණවත් පාලන විධිවිධාන හඳුන්වා දී නොතිබුණි.

3.3 නිශ්ක්‍රීය ඌණ උපයෝජිත වත්කම්.

---

රු.5,934,000 කට මිලදීගෙන තිබුණු බස් රථය සඳහා පසුව රු.2,667,929ක අලුත්වැඩියාවක් සිදු කර 2012 ජූනි මාසයේ සිට ධාවනයෙන් ඉවත් කර තිබුණි.

3.4 ආර්ථික නොවන ගනුදෙනු

---

බිබිල, රාගල, හොරොව්පතාන, මහියංගනය, වීරකැටිය,බත්තුළුඔය සහ නිකවැරටිය යන ප්‍රදේශවල නිවාඩු නිකේතන 7ක් සඳහා දැනට වර්ෂ 2 කට පෙර සිට ආරක්ෂක කටයුතු සඳහා රු.මිලියන 2.1 ක් පමණ වැය කර තිබුණි. එහෙත් මෙම නිකේතන ඵලදායි ලෙස ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

3.5 හඳුනාගත් පාඩු

----------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අධිකාරිය සතු කොළඹ පිහිටි සංස්කෘතික මධ්‍යස්ථාන ගොඩනැගිල්ල (Dutch Hospital) ක්ෂය අඩුකල වටිනාකමට රු.7,274,715 ක් අඩුවෙන් නාගරික සංවර්ධන අධිකාරියට පවරා තිබුණි.

(ආ) ප්‍රධාන ගබඩාවේ භාණ්ඩ අයිතම 13 කට අදාලව එම භාණ්ඩවල ලකුණු කල මිලට වඩා වැඩිපුර මිලක් ගෙවා භාණ්ඩ ලබා ගැනීම නිසා අධිකාරියට රු. 133,138ක මුදලක් පාඩු වී තිබුණි.

3.6 කොන්ත්‍රාත් පරිපාලනය

--------------------------

පාසිකුඩා සංචාරක නිකේතන ව්‍යාපෘතියේ වැසි වතුර බැස යාමේ කාණු පද්ධතිය ඉදි කිරීමට අදාල විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) ඉදිකිරීම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන භූමියේ භූ විෂමතාව සැලකිල්ලට ගෙන පරිමාණ සටහන් සහ පිරිවිතර සකස් කර නොතිබුණි.

(ආ) අධිකාරියේ සැලසුම් හා සංවර්ධන අංශයේ අධ්‍යක්ෂවරයා මෙම ව්‍යපෘතියේ තාක්ෂණික ඇගයීම් කමිටුවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කර ඇති අතර ඔහු විසින් මෙම ව්‍යාපෘතියට අදාලව රු.31,394,813 ක ගෙවීම් වවුචරද සහතික කර තිබුණි. එමෙන්ම මෙම අධ්‍යක්ෂවරයා යටතේ කොන්ත්‍රාත් පදනම මත සේවය කල නිකේතන නිලධාරී විසින් උක්ත ගෙවීම් වවුචර්වලට අදාල මිණුම් වාර්තා සහ ගෙවීම් බිල්පත් පරික්ෂාකර සහතික කර ගෙවීම් වවුචරද පිළියෙල කර තිබුණි. නිලධාරීන්ට එම කාර්යයන් සඳහා තිබෙන වෘත්තීය නිපුනතාවය සහ ස්වාධීනත්වය පිළිබඳ විගණනයේදී සෑහීමකට පත්විය නොහැක.

3.7 ව්‍යාපෘති ප්‍රමාදයන්
--------------------

අතිරේක කාමර 4,000ක් සහිත නිකේතන ඉදිකිරීම සහ යටිතල පහසුකම් ඇති කිරීම පිණිස රු.මිලියන 5,521 ක ඇස්තමේන්තුගත පිරිවැයක් යටතේ ක්‍රියාත්මක කර තිබුණු කල්පිටිය ඒකාබද්ධ සංචාරක ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කල්පිටිය ඒකාබද්ධ සංචාරක සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර වර්ෂ 5කින් නිම කිරීම සඳහා අවශ්‍ය අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහ මහා භාණ්ඩාගාරයේ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය 2008 වර්ෂයේදී ලබාගෙන තිබුණි. එසේ වුවත්, 2012 දෙසැම්බර් 31 දින දක්වා එක් කාමරයක්වත් නිම කර නොතිබුණි.

(ආ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සැලැස්මක් සහ ව්‍යාපෘතියේ කළමනාකරණ වියදම්, උපදේශන හා ප්‍රාග්ධන වැඩ යනාදිය ආවරණය වන පරිදි විස්තරාත්මක අයවැයක් පිළියෙල කර නොතිබුණි.

(ඇ) මෙම ව්‍යාපෘතිය යටතේ ඉඩම් 14ක් ආයෝජකයින් සඳහා ලබා දීමට සැලසුම් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ආයෝජකයින් වෙත ලබාදී තිබුණේ ඉඩම් කට්ටි 4ක් පමණි.

3.8 මානව සම්පත් කළමනාකරණය
-----------------------------------

අධිකාරියේ අනුමත සේවක සංඛ්‍යාව සේවාව තනතුරු 31ක් යටතේ වර්ගීකරණය කර 192ක සංඛ්‍යාවක් කළමනාකරණ සේවා දෙපාර්තමෙන්තුව විසින් අනුමත කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේ තත්‍ය සේවක සංඛ්‍යාව පිළිවෙලින් 154ක් සහ 176 ක් විය.

4. ගිණුම් කටයුතුභාවය හා යහ පාලනය
----------------------------------------

4.1 සංයුක්ත සැලැස්ම
-------------------

2012 සිට 2016 වර්ෂය දක්වා වර්ෂ 4 ක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණි. මෙම සැලැස්මේ සඳහන් අයිතම කිහිපයක් සඳහා ඉලක්ක සඳහන් කර නොතිබුණු අතර එක් එක් වර්ෂය අවසානයේ ලඟා කරගත යුතු ඉලක්ක කාලානුරූපව සමාලෝචනය කර යාවත්කාලීන කර නොතිබුණි.

4.2 ක්‍රියාකාරී සැලැස්ම

--------------------

සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණි. එම ක්‍රියාකාරී සැලැස්මේ කාල නියමයන් සඳහන් කර නොතිබුණු අතර, ක්‍රියාකාරී සැලැස්මේ ඉටු කර ගැනීමෙ ප්‍රගතිය කාලානුරූපව පරීක්ෂා කිරීම සඳහා ක්‍රමෙවේදයක් හඳුන්වා දී නොතිබුණි.

4.3 අයවැය ලේඛණමය පාලනය

-------------------------------

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත හා තථ්‍ය වියදම් අතර සැලකිය යුතු විචලනයන් (විචලන පරාසය 20% ඉක්මවූ) සහිත වැය විෂයන් 20ක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛණය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන තිබුණු බව දක්නට නොලැබුණි.

5. පද්ධති හා පාලන

-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) සංවර්ධන වැඩසටහන්

(ඇ) ව්‍යාපෘති කළමනාකරණය

(ඈ) වත්කම් කළමනාකරණය

(ඉ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(ඊ) බලපත්‍ර නිකුත් කිරීම